# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2176/4 - 2020 මැයි මස 18 වැනි සඳුදා - 2020.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදනය

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ කරනු ලබන නියමය

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (2) උප වගන්තියෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් කරුණු/චෝදනා හේතු කොටගෙන එස්. ඒ. එන්. කේ. සකලසූරිය මහතා දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් කටයුතු කිරීමේදී ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 185 (1) උපවගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදුකර තිබේද යන්න පරීක්ෂා කර මාස 3ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ඒක පුද්ගල පරීක්ෂණ සභාවක් වශයෙන් විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු චන්ද්‍රදාස නානායක්කාර මහතා පත් කරමි.

දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති එස්. ඒ. එන්. කේ. සකලසූරිය මහතාට අදාළව පරීක්ෂා කළයුතු කරුණු/චෝදනා නම්, එකී චෝදනා කවරේද යත්,

I. දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් 2020.03.30 වැනි දින සිට 2020.04.08 වැනි දින දක්වා අතර කාල සීමාව තුළ හෝ ඊට ආසන්න කාල සීමාවකදී දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලින් ලබාගත් අත්තිකාරම් මුදල් යොදවා රජයේ පාලන මිලට වඩා වැඩි මිලකට පරිප්පු හා සැමන් පෞද්ගලික වෙළෙඳ ස්ථානයකින් මිලට ගැනීමට ක්‍රියා කිරීමෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) (ඇ) හා/හෝ 185 (1) (ඉ) වගන්තිය/වගන්තිය යටතට ගැණිය හැකි වරදක් සිදුකිරීම.

II. දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් 2020.03.30 වැනි දින සිට 2020.04.08 වැනි දින දක්වා අතර කාල සීමාව තුළ හෝ ඊට ආසන්න කාල සීමාවකදී දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ අරමුදලින් මුදල් යොදවා මිලදී ගන්නට යෙදී ඇති සැමන් හා පරිප්පු රජයේ පාලන මිලට වඩා වැඩි මිලකට පාරිභෝගික ජනතාව වෙත විකිණීමට ක්‍රියා කිරීමෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) (ඇ) හා/හෝ 185 (1) (ඉ) වගන්තිය/වගන්ති යටතට ගැණිය හැකි වරදක් සිදුකිරීම.

III. ඔබ දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් 2020.03.30 වැනි දින සිට 2020.04.08 වැනි දින දක්වා අතර කාල සීමාව තුළ හෝ ඊට ආසන්න කාල සීමාවකදී "COVID - 19 වෛරසය මැඩලීම සඳහා ජනතාව වෙත අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සැපයීම" සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කරන ලද අංක LGD/2A/පොදු හා 2020.03.24 දිනැති චක්‍රලේඛණ උපදෙස්වලට පටහැනිව දිවුලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජනතාව වෙත රජයේ පාලන මිල ඉක්මවා ආහාර ද්‍රව්‍ය අලෙවි කිරීමට ක්‍රියා කිරීමෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) (ඇ) වගන්තිය යටතට ගැණිය හැකි වරදක් සිදුකිරීම.

තව ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (2) උපවගන්තියෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත්කරන ලද කොමසාරිස්වරයෙකු සතු බලතල මෙම ඒකපුද්ගල පරීක්ෂණ සභාව වෙත හිමිවන අතර, ඉහත සඳහන් කරුණු පරීක්ෂා කිරීමේදී අදාළ කරගත යුතු බවට හඳුනාගත් ලිඛිත හා වාචික සාක්ෂි පහත උපලේඛනයට ඇතුළත් කර ඇති බව ද නිවේදනය කරමි.

තව ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 6(3) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති වන එස්. ඒ. එන්. කේ. සකලසූරිය යන අය එකී සභාපති ධූරය දැරීම ඉහත කී පරීක්ෂණයට යටත්ව 2020 මැයි මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෙයින් අත්හිටුවන බවද මෙයින් නිවේදනය කරමි.

තව ද, ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (3) උපවගන්තිය යටතේ වැඩි දුරටත් සඳහන් විධිවිධාන අනුව, එසේ අත්හිටුවනු ලබන දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, කාර්යය ඉටු කිරීමටත් දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති ටී. ටී. ඉන්දික ජයසිංහ වෙත මෙයින් විධාන කරන බවද වැඩිදුරටත් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී
පීඑච්ඩී එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2020 මැයි මස 18 වැනි දින,
බත්තරමුල්ල, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**ඉහත චෝදනා සනාථ කිරීම සඳහා උපයෝගී කරගත යුතු ලිඛිත සාක්ෂි**

(1) දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයේ අත්තිකාරම් ලේඛනය.

(2) දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයේ මුදල් හා ප්‍රතිපත්ති කමිටු ලේඛනයේ අවසන් පිටුවල සහතික කල උධෘත.

(3) දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ වවුචර් අංක 511 හා 2020.03.28 දිනැති වවුචරය ඇමුණුම් සමග.

(4) දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ වවුචර් අංක 510 හා 2020.03.28 දිනැති වවුචරය ඇමුණුම් සමග.

(5) දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ වවුචර් අංක 512 හා 2020.03.30 දිනැති වවුචරය ඇමුණුම් සමග.

(6) දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ වවුචර් අංක 532 හා 2020.04.08 දිනැති වවුචරය ඇමුණුම් සමග.

(7) දිවුලපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය මගින් නිකුත් කළ අංක 6644 හා 2020.03.28 දිනැති විකුණුම් පතෙහි සහතික කළ උධෘතය.

(8) දිවුලපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය මගින් නිකුත් කළ අංක 6632 හා 2020.03.27 දිනැති විකුණුම් පතෙහි සහතික කළ උධෘතය.

(9) මාලින්ද ස්ටෝස්, දිවුලපිටිය ආයතනයෙන් නිකුත් කළ පරිප්පු ඇතුළු ආහාර ද්‍රව්‍ය මිලට ගැනීමට අදාළ 2020.03.30, 2020.03.31, 2020.04.04 හා 2020.04.08 දිනැති බිල්පත් 4හි සහතික කරන ලද පිටපත්.

(10) දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ 2020.03.28 දිනැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ සහතික කළ උධෘතය.

(11) 2020.04.28 දින රු. 400,000ක අත්තිකාරම් පියවූ දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ අංක 76452 ලඳුපතේ සහතික කළ උධෘතය.

(12) දිවුලපිටිය ප්‍රාදේශීය සභාවට අයත් ලොරි රථයකින් වැඩි මිලට භාණ්ඩ අලෙවි කිරීමට අදළ වන ගොණුව.

(13) ශ්‍රී ලංකා පාරිභෝගික සේවා කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපතිතුමන්ගේ 2020.04.16 දිනැති වාර්තාවේ සහතික කළ උධෘතය.

**ඉහත චෝදනා සනාථ කිරීම සඳහා උපයෝගි කරගත යුතු වාචික සාක්ෂි**

| | නම | | තනතුර |
|---|---|---|---|
| 1. | එම්. ශාන්ති චන්ද්‍රලතා මිය | - | ලේකම්, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව |
| 2. | එස්. ඩී. කේ. ඩී. සතරසිංහ මිය | - | කළමනාකරණ සහකාර, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව |
| 3. | එම්. පී. මුදිත දිවාකර සුබසිංහ මයා | - | වැඩ/ක්ෂේත්‍ර කම්කරු, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව |
| 4. | අයි. ඒ. රුවන් ධනංජය මයා | - | වැඩ/ක්ෂේත්‍ර කම්කරු, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව |
| 5. | එම්. පී. ඩබ්. ජී. ගුණවර්ධන මයා | - | ප්‍රධාන කළමනාකරණ සහකාර, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව |
| 6. | පී. පී. රන්දිම ගයාන් | - | රියදුරු, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව |
| 7. | කේ. ඉසුරු චාමාක | - | සෞඛ්‍ය කම්කරු, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව |
| 8. | සාමාන්‍යාධිකාරි හෝ ඔහු විසින් නම් කරන ලද බලයලත් නිලධාරියකු | - | සී/ස දිවුලපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය |
| 9. | සභාපති හෝ ඔහු විසින් නම් කරන ලද බලයලත් නිලධාරියකු | - | ශ්‍රී ලංකා පාරිභෝගික සේවා අධිකාරි |
| 10. | ඊ. සී. එම්. චතුරාංගනී | - | විමර්ශන නිලධාරී, සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය, ගම්පහ දිස්ත්‍රික්කය. |

05 - 32

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.